# අධ්‍යාපන ඇමැති කාලයේ ධවල පත්‍රිකාවක් ගෙනත් නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න හැදූ අය ගැන ජනතාව හොඳින් දන්නවා

## ජාතික විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරු පත්වීම් දීමේ උත්සවයේදී ජනපති කියයි



ගුරු සේවයට බඳවා ගත් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කිරීම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අතින් අරලියගහ මන්දිරයේදී ඊයේ (04) සිදු කෙරිණි. ඩිප්ලෝමාධාරීනියන් සමග ජනාධිපතිතුමන් සුහද කතාබහක යෙදී සිටියදී.
*ඡායාරූප – කමල් ජයමාන්න*

**විමල් ප්‍රේමරත්න**

දේශපාලන වාසි ලබා ගැනීමට රට බාල්දු කරමින් ලෝක ජනතාව ඉදිරියේ දනගසන සමහර අයගේ අතීතය මේ රටේ ජනතාවට හොඳට මතක ඇති බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුපත්වීම් ලබාදීම වෙනුවෙන් ඊයේ (4) අරලියගහ මන්දිරයේ පැවති උත්සවයක් අමතා මේ බව සඳහන් කළ ජනාධිපතිවරයා ඇතැම් අය අධ්‍යාපන ඇමැතිවරයාව සිටියදී අධ්‍යාපන ධවල පත්‍රිකාවක් ගෙනැල්ලා මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න උත්සාහ කළ හැටි මේ රටේ ජනතාව හොඳකාර දන්නා බවද කීය.

ජනාධිපතිවරයා මෙහිදී තවදුරටත් කතා කරමින් මෙසේද කීය.

ලෝකයේ තියෙන වටිනාම රස්සාවක් කරන්නයි තමුන්නාන්සේලා අද රාජ්‍ය සේවයට එන්නේ. රස්සාවක් කරලා වැඩුම් ලබන්න පුළුවන් ගුරු සේවයට විතරයි. මම මේක වෘත්තීය කියලා හඳුන්වන්න කැමති නැහැ. මේක සේවාවක්, වැඳුම් ලබන සේවාවක්. කතාවක් තියෙනවනේ "රජකමටත් වඩා ගුරුකම උතුම්" කියලා.

හැබැයි මම ආරම්භයේදීම කියන්න ඕනෑ. රස්සාවක් කියලා හිතලා මේ සේවය කරන්න එපා. එහෙම වුණොත් සැබෑ ගුරුවරයෙක් වෙන්න බැහැ. මෙතන ඉන්නේ තරුණ පිරිසක්. ඒ නිසා මම හිතනවා අද දැඩි අධිෂ්ඨානයෙන් මේ කාරණය හිතට ගනී කියලා.

රටේ මොන ප්‍රශ්න තිබුණත් අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන ශතයක්වත් අඩුකරන්න අපේ රජය කටයුතු කරන්නේ නැහැ.

අපි විශ්වාස කරන්නේ අධ්‍යාපනය නගා සිටුවීම අපේ රජයේ යුතුකමක් හැටියට නෙමෙයි. අප මත පැවරිලා තියෙන දැවැන්ත වගකීමක් විදිහටයි මම දකින්නේ.

තවමත් සාක්ෂරතාව අතින් අපි දෙවැනි වෙන්නේ ආසියාවේ රටවල් අතරින් ජපානයට විතරයි. අපට පුළුවන් වෙන්න ඕනෑ සාක්ෂරතාවය අතින් ලෝකේ ඉහළම තැනට එන්න. මේ සඳහා අපේ රජය දැඩි වගකීමෙන් කටයුතු කරනවා. අදින් පස්සේ තමුන්නාන්සේලාටත් ඒකට විශාල වගකීමක් පැවරෙනවා.

මේ වර්ෂයට වඩා අධ්‍යාපන මට්ටම ලබන වසරේදී වැඩි කළයුතුය. ඒ සඳහා අධ්‍යාපන ඇමැතිවරයාට උපදෙස් ලබාදී තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා එක පැත්තකින් අපි මේ රටේ ස්වෛරීභාවය රැක ගැනීමේ දැඩි අධිෂ්ඨානශීලී මාවතක ගමන් කරනවා.

අපේ රටේ අභිමානය හෑල්ලුවට ලක් කරන්න ඇතැම් අය ලෝකේ රටවල් ඉදිරියේ දන ගහනවා. අපි ඒවාට කලබල වෙන්නේ නැහැ. මේ අයගේ ඉතිහාසය රටේ ජනතාවට මතකයි. මේක අපරාධයක්. දේශපාලන බලය ලබා ගැනීමට රට බාල්දු කිරීම හොඳ නැහැ. මෙයා අධ්‍යාපන ඇමැතිවරයාව සිටි කාලේ තමයි අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනැල්ලා මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න උත්සාහ කළේ. නමුත් අපි නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර ගන්නවා.

මම විශ්වාස කරනවා ගුරුවරයාගේ සේවා ගරුත්වය ආරක්ෂා කළ යුතුයි කියලා. ඒ නිසා වෘත්තීමය ගරුත්වයක් රකින්න අවශ්‍ය පියවර අපි මේ වන විට ගෙන තිබෙනවා. අපි ගුරුවරුන්ගේ පඩි වැඩි කළා.

ගුරු පඩි වැඩි කරලා විතරක් වෘත්තීය ගරුත්වය ආරක්ෂා කරන්න බෑ. පෞද්ගලික අංශයේ රැකියා කරන අය පරිහරණය කරන නවීන විද්‍යා දැනුම ගුරුවරයකු ළඟ නැත්නම් එයාට සමාජයේ පිළිගැනීමක් නැතිව යනවා.

ඒ නිසා අපි පසුගිය අවුරුද්දේ මාර්තු මාසයේ ජාතික ගුරු පරිගණක වැඩ සටහන ආරම්භ කළා ගුරුවරුන්ගේ පරිගණක දැනුම දියුණු කරන්න. දැන් ගුරුවරයකුට රාජ්‍ය බැංකු තුනකින් සහන පොලියට පරිගණක දෙනවා. ඒ වගේම අපි පරිගණක පාඨමාලා නොමිලේ හැදෑරීමේ අවස්ථාව ලබාදීලා තියෙනවා.

මම ජීවමාන උදාහරණයක් දෙන්නම්. අනුරාධපුරේ මහවිලච්චිය ගමේ මහවිලච්චිය මහා විද්‍යාලයේ උගන්වනවා නන්දසිරි වන්නිනායක කියලා ගුරුතුමෙක්. මේ ගුරුතුමා බොහොම මහන්සිවෙලා පරිගණක ශිල්පයත් ඉංග්‍රීසිත් ඉගෙන ගෙන තමන් උගන්වන මුළු ඉස්කෝලෙම දරුවන්ට ඉංග්‍රීසිත් පරිගණකත් ඉගැන්නුවා.

01 02 පිටුවට

උණුසුම් පුවත් .........
ප්‍රධාන පිටුවට යාමට

# අධ්‍යාපන ඇමැති කාලයේ ධවල පත්‍රිකාවක් ගෙනත් . . . . . . .




ගුරු පත්වීම් ලාභීනියකට ජනපතිවරයා පත්වීම් ලිපිය ප්‍රදානය කළ ආකාරය.

මේ බව ආරංචි වෙලා පහුගිය අවුරුද්දේ ජනාධිපති ලේකම්තුමා මේ ඉස්කෝලේට ගියා. මම ආඩම්බරයෙන් කියන්නේ මේ ගුරුතුමා ගැන, මේ පාසලේ දරුවෝ සියයට 90 කට වඩා ඉංග්‍රිසි කතා කරන්න පුළුවන්. ඒ වගේම පරිගණකයෙන් හොඳට වැඩ ගන්නත් පුළුවන්. ජනාධිපති ලේකම්තුමා ඉස්සරහා ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණක තාක්ෂණය ගැන විස්තර කරන්න ඒ මහවිලච්චිය මහා විද්‍යාලයේ දරුවන්ට පුළුවන්කම තිබුණා.

ඒ විතරක් නොවෙයි ඒ ගමේ ගුරුතුමා හින්ද දැන් ඒ ගමේ දරුවෝ බොහොම දෙනෙක් පරිගණක පාවිච්චි කරලා අන්තර්ජාලයට යනවා. කොළඹ තියෙන සමාගම්වලට වෙබ් අඩවි හද දෙනවා. පිටරටවල සමාගම් එක්කත් පරිගණක භාවිතා කරලා වැඩ කරනවා.
හැබැයි මහවිලච්චිය ගමේ සමහර දරුවෝ කොළඹ දැකලවත් නැතිව ඇති. ඒ වුණාට ඒ ගමේ දරුවන්ව විශ්ව පුරවැසියෝ කරන්න නන්දසිරි වන්නිනායක කියන එක ගුරුතුමෙකුට පුළුවන් වුණා.

මට මේ හාස්කම අපේ ලේකම්තුමා කිව්වහම අපි තීරණය කළා “ඊ විලේජ්” කියන සංකල්පය මේ රටේ ඇති කරන්න. ගිය අවුරුද්දේ අයවැයෙන් අපි මිලයන සියයක් ඒකට වෙන් කළා.

අධ්‍යාපන ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතා - මේ රටේ පවතින ගුරු හිගය මගහරවා ගැනීමට ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි සෑම ක්ෂේත්‍රයටම අයත් ගුරුවරු බඳවා ගන්නවා. එයට අමතරව උපාධිධාරී ගුරුවරුද බඳවා ගන්නවා.
විධිමත් පුහුණුවකින් පසුවයි මෙම පිරිස පංති කාමරයට යොමු කරන්නේ.

කැලණි විශ්ව විද්‍යාලයේ කුලපති වැලමිටියාවේ කුසලධම්ම හිමියන් පැමිණ සිටි පිරිස පංචශීලයේ පිහිට වූ අතර, බස්නාහිර පළාතේ මහ ඇමති රෙජිනෝල් කුරේ මහතාද පැමිණ සිටි පිරිස අමතා කතා කළේය.
බස්නාහිර පළාත් ආණ්ඩුකාර අලෙවි මවුලානා, අධ්‍යාපන සේවා ඇමැති නිර්මල කොතලාවල ඇතුළු කීපදෙනෙක් උත්සව සභාවට සහභාගි වී සිටියහ.

01 02 පිටුවට

උණුසුම් පුවත් . . . . . . . . .
ප්‍රධාන පිටුවට යාමට